# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබාදීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

තාක්ෂණික පත්‍රිකා අංක 35 - 2021 මැයි


## පළිබෝධනාශක ඉසින්නට ඔබ සූදානම්න් ද ?



නාගරීකරණය, කාර්මීකරණය වැනි පද හරහා අපහට සන්නිවේදනය කෙරෙන්නේ සොබාදහමට අනුකූලවන ජීවන රටාවකින් අප කොපමණ ප්‍රමාණයක් ඈතට ගමන්කර ඇතිද යන්නයි. සොබාදහම සමග උරෙන් උර ගැටී ජීවත් වෙනවාට වඩා කීපගුනයකින් වැඩි අවදානමක් මේ නවීකරණය හරහා අපගේ දිවිපෙවෙත හා බද්ධ වී තිබේ. ප්‍රවේසම් වියයුතු ප්‍රමාණයද ඊට සම්පාතව වැඩිවී ඇත. ගම්බද නිවෙසකට වුවත් මේ වනවිට නැතිවම බැරි පහසුකමක් සේ සලකන ඉතා අන්තරාදායී වන විදුලි බලය, ප්‍රවේසමෙන් පරිහරණය කරන්නට වැඩිපුර දැනඋගත් කමක් නොමැති පුද්ගලයෙක් වුවත් අද දවසේදී අත හුරුකරගෙන සිටී. එසේ නමුත් එවැනි පරිශීලන රටාවක් ජීවිතයේ මුණගැසෙන හැම අවදානමකටම යොදවන්නේදැයි සැක සහිත බව පෙනෙන්නේ, නිරුවත් උඩුකයෙහි පිටුපස පළිබෝධනාශක ඉසිනයත් එල්ලාගෙන, බුලත් විටක්ද හපමින්, මහ දහවලෙහි කෙතට දියර ඉසිනා ගම්බද ගොවියෙකුගේ දසුන එතරම් විරල එකක් නොවන්නා බැවිනි.

කෙතරම් අකමැති වුවත්, අත්‍යවශ්‍ය අවස්ථාවන්හිදී අවම ප්‍රමාණයන්ගෙන් හෝ පළිබෝධනාශක භාවිතා කිරීමට වාණිජ කෘෂිකර්මාන්තයේ නියැලෙන අපහට සිදුවී තිබේ. මේවා යොදන්නේ ශාක හෝ සතුන් වශයෙන් ගැනෙන තවත් ජීවියෙකුට එරෙහිවය. ඒ ඔවුන් පලවා හරිනවාට වඩා මරා දමන්නටය. එසේනම් එහි සුළු මාත්‍රාවක් හෝ ඇසුරුකිරීම මිනිසාට වුවද යම් තරමකින් අහිතකර නව පුන පුනා පැවසිය යුතු නොවේ. සුළු ප්‍රමාණවලින් දිගු කාලයක් තිස්සේ ශරීර ගතවීම වඩාත් භයානක වන්නේ දෛනික විෂවීමේ සංඥාවක් පවා නොමැතිව, මාරයාගේ සමීපවීමක් එතැන ඇති බැවිනි. තවත් වගා කන්නයක් උදාවී ඇති මේ දිනවලදී ගොවි ජනතාව වැඩි වැඩියෙන් පළිබෝධනාශක ඇසුරුකරනා නිසා මෙවර අප අවධානය යොමුකරවන්නේ ඔබ වඩාත් සංවේදීව සිතාබැලිය යුතු ආරක්ෂක ඇඳුම් පිළිබඳවය.

ආරක්ෂිත ඇඳුම් රහිතව පළිබෝධනාශක යොදන පුද්ගලයෙක්



ආරක්ෂිත ඇඳුම් සහිතව පළිබෝධනාශක යොදන පුද්ගලයෙක්



**“විදෙස් රටවලදීනම් අපි දකිනවා පළිබෝධනාශක යොදන උදවිය අනිවාර්යයෙන්ම විශේෂ ඇඳුමකින් සැරසෙනවා. ලංකාවෙත් විධිමත් ලෙසව සංවිධානගතව ඉදිකිරීම් යනාදිය කරනවිට එයට සුදුසු**

**ඇඳුම් වලින් සැරසෙනවා. එලෙස සැරසී වැඩකරන උදවිය පවා වගා කන්නය ආරම්භයේදී තමන්ගේ කුඹුරට පළිබෝධනාශක ඉසිද්දී ආරක්ෂක පිළිවෙත් කිසිවක් සලකන්නේ නෑ. මෙය ඉතා අවාසනාවන්ත තත්වයක්"**

මෙසේ පවසන්නේ බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ වල්පැලෑටි විද්‍යාව පිළිබඳ විශේෂඥ, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ආර්.එම්.යූ.එස්. බණ්ඩාර යි. ඉහතෙම පවසනා පරිදි මිනිස් සිරුරේ විවිධ නිරාවරණය වූ ප්‍රදේශයන් හරහා ශරීරයට උරාගන්නා රසායන ද්‍රව්‍යයන්ගේ ප්‍රමාණයන්ද එකිනෙකට වෙනස්ය. මෙහි ඇති රූපයෙන් පෙන්වා දෙන්නේ එම ප්‍රමාණයන්ගේ දළ සටහනකි. එයට අනුව හිසෙහි සම, කණ, නළල හා ලිංගේන්ද්‍ර ප්‍රදේශය වඩාත් සංවේදී ස්ථානයන් බව පෙනේ. මේ අතරින් පළමු පෘෂ්ඨයන් ත්‍රිත්වය දේශීය ගොවියාගේ නිරන්තරයෙන්ම විවෘතව පවතින ස්ථානයන්ය. ඒ නිසා ආරක්ෂක ඇඳුමක ආවරණයක් නොමැතිව පළිබෝධනාශක ඉසින ගොවියෙක් මුහුණදෙන අවදානම කෙබඳුදැයි වටහා ගැනීම අපහසු නොවේ. කෘෂි බලධාරීන්ගේ වගකීමක් විය යුත්තේ මෙම සංඛ්‍යා දත්තයන්ද සමග ගොවි ප්‍රජාව දැනුවත් කිරීමයි. ආහාරයට වසවිස එකතුවීමක් ගැන මහහඬින් කතාකරන සමාජයක් මෙම කරුණ සම්බන්ධයෙන් කෙඳිරිල්ලක්වත් නොනැගීම බලවත් අඩුපාඩුවකි.




**"පළිබෝධනාශක යොදන අවස්ථාවේ භාවිතා කලයුතු ඇඳුමේ අනිවාර්ය කොටස් කීපයක් තිබෙනවා. ඇස්, හිස හා මුහුණ ආවරණය වී තිබිය යුතුයි. මීට අමතරව අත්ල වැසෙන්නට ග්ලවුස් දමාගෙන අත්දිග කමිසයක් හා දිග කලිසමක් ඇඳ සිටීම වැදගත්. උස බූට් සපත්තු දමා සිටිනවානම් හොඳයි. ඝෝෂාකාරී යන්ත්‍රයක් භාවිතයෙන් දියර ඉසිනවානම් කන් වලටත් ආවරණයක් දැමිය යුතු වෙනවා. මතක තබාගත යුතු තවත් විශේෂ කරුණක් නම් දියර ඉසින අතරතුරදී බුලත්විට යනාදී දෙයක්වත් සැපීම නොකළ යුතු බව"**




බණ්ඩාර මහතා තවදුරටත් පෙන්වා දෙන්නේය. ගම්බද නාගරික භේදයකින් තොරව පිටරැටියන් අඳින පළඳින බොහෝ මෝස්තර හා ආයිත්තම් යුහුසුළුව අනුකරණය කරනා අප, පළිබෝධනාශක ඉසින ඇඳුම පමණක් අනුකරණය කරන්නට මෙතරම් පමාවීමේ හේතුව කුමක්ද යන්නත් සොයා යාම කලයුත්තක් යයි සිතේ.

**පිටපත :** සනත් එම්. බණ්ඩාර - සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව

**තාක්ෂණික කරුණු :** ආර්.එම්.යූ.එස්. බණ්ඩාර, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ

(දැනට මෙම සම්පත් දායකයා මැලේසියාවේ University Putra Malaysia හි පශ්චාද් උපාධි අධ්‍යයනයන්හි නිරතව සිටී)


පරිගණක නිර්මාණය : ගෝතමී ලියනගේ

අධීක්‍ෂණය හා උපදෙස් : ඩබ්.එල් හිරාන් පීරිස් (අධ්‍යක්‍ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ)